# නාලන්ද බොදුහඬ

ආදි නාලන්දීය බෞද්ධ සංගමයේ ප්‍රකාශනයකි

සිව්වන කලාපය - ශ්‍රී බුද්ධ වර්ෂ 2552 වූ බිනර මස (සැප්තැම්බර් 2008)


# බෞද්ධ අධ්‍යාපනය ඔප කළ නාලන්දා සම්ප්‍රදාය

"මම ආනන්දයේ උගන්වන කාලේ කුලරත්න මහත්මයා පාසලක් පටන් ගත්තා. ඒ ආනන්දයේ ප්‍රාථමික පාසල හැටියට පවත්වාගෙන යන්නයි එතුමා අදහස් කළේ. එහි ප්‍රධානියා ලෙස ආනන්දයෙන් යැව්වේ මෙත්තානන්ද මහත්තයා. මටත් කිව්වා වයසින් බාල හොඳම ශිෂ්‍යයින් කීප දෙනෙක් අරගෙන ඇවිත් ඒ ඉස්කෝලේ වැඩ කරන්න කියලා. ඒ අලුත් පාසල තමයි නාලන්දා මහා විද්‍යාලය. ඒ නම තිබ්බෙත් මම. මම මෙසේ 1923 ජනවාරි 01 දින නාලන්දාවට බැඳුන දවසේ මෙත්තානන්ද මහත්තයා සමග කතා කළා. ආනන්දය වගේම ඉහළ තත්ත්වයේ පාසලක් බවට නාලන්දය පත් කරන්න ඕනෑ කියලා "අපදාන සොභිණී පකද්කළා" <u>(චරිතයෙන් නුවණ බබලන්නීය.)</u> යන ආදර්ශ පාඨය දුන්නෙත් මම. ටික කලක් නාලන්දා විද්‍යාලයේ උගන්වන කොට මලලසේකර මහත්මයා එංගලන්තයේ ඉඳලා ආචාර්ය උපාධිය ලබාගෙන ලංකාවට ආවේ. ඔහුට බාර දුන්න සිංහල පාලි අංශය. මගේ අඩුව පුරවන්න මම හොයලා දුන්නා නාලන්දාවට හිනටියන ධම්මාලෝක හාමුදුරුවෝ."

නාලන්දාවේ ආරම්භය පිළිබඳ අතීතය සිහිපත් කළේ නාලන්දාවේ ප්‍රථම ධර්මාචාර්ය වූ අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රීය මහා නාහිමියනුයි. බෞද්ධ අධ්‍යාපනයේ මුදුන් මල් කඩක් බඳු නාලන්දා විද්‍යාලය ආරම්භ වූයේ ජාතියේ මුර දේවතාවුන් වන සඟ රත්නයත් දේශප්‍රේමී බෞද්ධ ජනනායකයින්ගෙත් අනුපමය උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි.

පාණදුරා මහා වාදයෙන් ඇති වූ බෞද්ධ පුනරුදයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ අධ්‍යාපන පද්ධතියක අවශ්‍යතාවය තදින් දැනිනි. එවකටත් දොඩන්දුවේ පියරත්න නාහිමියන් ආදී සංඝ පීතෘවරුන් බෞද්ධයන් සඳහා පාසල් ආරම්භ කර තිබිණ. එම බෞද්ධ පාසල් මගින් මිෂනාරීන්ගේ පාසල් මෙන් සැලසුම් සහගත, විධිමත් අධ්‍යාපන පටිපාටියකට අනුකූලව සැකසී නොතිබිණි. එබැවින් බෞද්ධයන් සඳහා ද විධිමත් අධ්‍යාපන පද්ධතියක අවශ්‍යතාවය හඳුනාගත් බෞද්ධ නායකයන්ට නව පාසල් ආරම්භ කිරීමට ශක්තිය ලබා දුන්නේ කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා යි. එතුමාගේ මග පෙන්වීම යටතේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමයක් සඳහා අඩිතාලම වැටිණ.

බෞද්ධ දරුවන් උදෙසා බෞද්ධ පාඨශාලා පිහිටුවීමේදී ඇති වූ ප්‍රධාන දුෂ්කරතාවයන් වනුයේ මුදල් හිඟකම සහ බොදුනු ජනතාව සංවිධානය නොවී සිටීමත්ය. මෙයට සංවිධානාත්මකව මුහුණ දීම සඳහා 1880 දී පරමවිඥානාර්ථ බෞද්ධ සංගමය සහ "සරසවි සඳරැස" පුවත්පත ආරම්භ කරනු ලැබූ අතර අරමුදල් රැස් කිරීම සඳහා 1881 දී බෞද්ධ අධ්‍යාපන අරමුදලක් ආරම්භ කරන ලදී.

මෙම සත්කාර්ය සඳහා අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල, පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක, පූජ්‍ය වස්කඩුවේ ශ්‍රී සුභූති, පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද ආදී නාහිමිවරුන්ගේ අනුශාසකත්වයත් දොන් කරෝලිස් හේවාවිතාරණ, දොන් අමාරිස් ද සිල්වා, බටුවන්තුඩාවේ පඬිතුමන්, ජෙරමියෙස් දියෙස්, අනගාරික ධර්මපාල ආදී ගිහි ප්‍රභූවරුන්ගේ දායකත්වයත් ලැබිණ. බෞද්ධ ජන නායකයෝ, ඉංග්‍රීසි රජයේ සහ මිෂනාරීන් ගේ බලවත් විරෝධතා මධ්‍යයේ සෑම නගරයක් පාසාම රැස්වීම් තබමින් ජනතාවට කරුණු කියා දෙමින් අරමුදල් රැස් කරනු ලැබිණ. එහි ප්‍රතිඵල වශයෙන් නව ඉංග්‍රීසි මාධ්‍ය බෞද්ධ පාඨශාලා හා ස්වභාෂා බෞද්ධ පාසල් පද්ධතියක් රට පුරා ආරම්භ විය. මෙම පාඨශාලා අතර කොළඹ ආනන්ද විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය, ගාල්ලේ මහින්ද විද්‍යාලය, මාතලේ විජය විද්‍යාලය, ගම්පොළ ජිනරාජ විද්‍යාලය සමහරක් වෙයි. මෙම පාසල් නිසා සිදු වූ ජාතික හා ශාසනික සේවය අති මහත්ය.

ඇති වූ ජාතික ආගමික ප්‍රබෝධයත් සමග විවිධ අභියෝගතා ජය ගනිමින් නව පාසල් මිෂනාරී පාසල් අභිබවා ඉදිරියට ගමන් කළේය. කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ද අධික විය. එහි ප්‍රතිඵලයක් ලෙස අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රීය මහා නාහිමියන් පැවසූ ආකාරයට නාලන්දාවේ උපත සිදු විය. මුලදී ඇති වූ බෞද්ධ පාසල් බහුතරයක විදුහල්පතිවරුන් හා ගුරුවරු වූයේ විජාතිකයින්ය. බොහෝ විට බටහිර ජාතිකයින්ය. එහෙත් නාලන්දාවේ විශේෂත්වය වනුයේ ආරම්භයේ සිටම සිංහල බෞද්ධ ජන නායකයින්ගේ සහ අධ්‍යාපනඥයින්ගේ ආභාෂය ලැබීමට තරම් භාග්‍යවන්ත වීමය. එබැවින් නාලන්දා සම්ප්‍රදාය සකස් වූයේ සම්පූර්ණයෙන්ම සිංහල බෞද්ධ චින්තනය අනුවය.

නාලන්දාවේ ආදි කර්තෘ වරයා වනුයේ පී. ද එස්. කුලරත්න මැතිතුමායි. එවකට ඔහු ආනන්දයේ විදුහල්පති ලෙස 1923 ජනවාරි 01 වන දින ආනන්දයේ ප්‍රාථමික අංශය කැම්බල් පෙදෙසේ ආරම්භ කරනු ලැබීය. එහෙත් ඔහුගේ අභිලාශය වූයේ මෙය වෙනම පාසලක් ලෙස පවත්වාගෙන යාමටයි. ඒ අනුව 1924 ජනවාරි 01 වන දින එවකට ආනන්දයේ සිටි දක්ෂ ගුරුවරයෙකු වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ නායකයෙකු වන එල්. එච්. මෙත්තානන්ද මහතා භාරයේ ද්විතීය අංශයෙන් දක්ෂ සිසුන් 330 ක් තෝරා ගෙන නව පාසලට යවනු ලැබීය. එවකට තිබූ රජයේ රෙගුලාසි අනුව පාසලක් ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන කොන්දේසි රැසක් සපුරාලිය යුතු විය. මේ සියල්ල ඉතා කෙටි කලකදී සපුරාලීමට එල්. එච්. මෙත්තානන්ද මැතිතුමන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා ම හැකි විය. ඒ අනුව 1926 නොවැම්බර් 01 වන දින ආනන්දයේ 39 වන සංවත්සර දිනයේදී නාලන්දාව රජයේ ලියාපදිංචි කරන ලදී. ලියාපදිංචි කරන ලද නාලන්දාවේ මුල්ම විදුහල්පතිතුමන් වූයේ මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමන්ය. මේ කාර්ය සඳහා මුල් වූවන් ගැන පී. ද එස්. කුලරත්න මැතිතුමන් පසුව මෙසේ පවසා ඇත.

"නාලන්දය ආරම්භ කරද්දී මා අපේක්ෂා කළ සේවය නාලන්දයෙන් ඉටු වී ඇත. නාලන්දාව බෞද්ධයන් දහදෙනෙකුගේ ව්‍යායාමයක ප්‍රතිඵලයෙකි. මෙම විද්‍යාස්ථානය සමග අනගාරික ධර්මපාලතුමා ද සම්බන්ධය. නාලන්දා ප්‍රාථමික අංශය සඳහා භූමි භාගය මිලදී ගැනීමට අවශ්‍ය මුදල් මා ණයට ගත්තේ එතුමාගෙනි. ආචාර්ය මලලසේකර මහතා ඒ මුදල පියවීමට ඉදිරිපත් විය. නාලන්දාව ආනන්දයේ අංකුරයකි. පැලය රෝපණය කර හදා වඩා ගැනීමට හැකි වීම මගේ පිනක් ලෙස සලකමි."

මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමන් විද්‍යාලය තුල බෞද්ධ පරිසරයක් ඇති කිරීමටත් ගොඩනැගිලි ආදී භෞතික සම්පත් දියුණු කිරීමටත් අධික වෙහෙසක් දරනු ලැබීය. "නාලන්දා කුසුම් දින" නමින් ගොඩනැගිලි අරමුදල් තර කිරීම සඳහා යොදා ගත් ව්‍යාපෘතියක් මෙතුමා විසින් ක්‍රියාවට නංවන ලදී. 1928 දී නාලන්දාවේ විදුහල්පති වූයේ ජේ. එන්. ජිනේන්ද්‍රදාස මැතිතුමායි. කලාවට ලැදියාවක් දැක්වූ මෙතුමා නිසා නාලන්දා විද්‍යාලයේ කලා ක්ෂේත්‍රය ප්‍රබෝධමත් විය.

මෙකල ගුරු මණ්ඩලයේ ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි වැනි කවීන් ද පණීභාරත වැනි නාට්‍ය ශිල්පීන්ගෙන් සමන්විත විය. යූ. ඒ. එස්. පෙරේරා (සිරි අයියා), හෙන්රි ජයසේන මහත්වරු එකල කලා සංගමයේ ප්‍රමුඛයන් විය. දෙවන ලෝක යුධ සමයේදී නාලන්දාවේ කොටසක් මිනුවන්ගොඩටත්, මහරගමටත් ගෙන යනු ලැබූ අතර, යුද්ධයෙන් පසු මිනුවන්ගොඩ ශාඛාව "නාලන්දා විද්‍යාලය" නමින් වෙනමම ලියාපදිංචි කරනු ලැබූ අතර නාලන්දාවෙන් බිහි වූ තවත් නාලන්දාවක් ඇති විය.

1939 වන විට ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භට කණ්ඩායමට හිමි වන හර්මන් ලූස් කුසලානය කෙටි කලක් තුළ 08 වතාවක් ම දිනාගැනීමට නාලන්දාව සමත් විය. මෙය කිසිදු විදුහලකට සම කළ නොහැකි වාර්තාවක් වෙයි. ආදී

නාලන්ද බොදුහඬ

සිව්වන කලාපය - ශ්‍රී බුද්ධ වර්ෂ 2552 වූ බිනර මස (සැප්තැම්බර් 2008)

නාලන්දීය ශ්‍රේෂ්ඨ සංඝ පිතෘවරයෙකු වන වජිරාමාධිකාරීව වැඩ විසූ ලොව පුරා ධර්මය ප්‍රචාරය කිරීමට පුරෝගාමීව කටයුතු කළ පියදස්සී නාහිමියන් ද තම පාසල් සමයේදී පාසල් ශිෂ්‍ය භට කණ්ඩායම නියෝජනය කරනු ලැබූවන් අතර විය.

1947 දී විදුහල්පති වූයේ භක්තිමත් බෞද්ධයෙකු වූ ඩී.සී. ලෝරිස් මැතිතුමායි. 1956 සිට 1962 දක්වා විදුහල්පති ලෙස කටයුතු කළ එම්. ඩබ්ලිව් කරුණානන්ද මැතිතුමා නාලන්දාවේ අධ්‍යාපනික මට්ටම ඉහළ තලයකට ගෙනයනු ලැබූහ. සිංහලෙන් විද්‍යාව ඉගැන්විය නොහැකි යැයි රටේ මතයක් ඇති වූ අවස්ථාවේ එය අභියෝගයකට ලක්කර විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමට ප්‍රමුඛ වූයේ කරුණානන්ද මැතිතුමායි. එම යුගයේදී හීනටියන ධම්මාලෝක නාහිමිගේ අනුශාසකත්වයෙන් සහ ආචාර්ය ඒ.ටී. ආරියරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කනතොළුව ග්‍රාමයෙන් ඇරඹි ශ්‍රමදාන ව්‍යාපාරය පසුව විශ්ව කීර්තියට පත් "සර්වෝදය" ව්‍යාපාරය බවට පත් විය. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන විශ්ව විද්‍යාලයක් වීම නිසා එහි පිරිවෙන් පන්ති පැවැත්වීමට අපහසු වූයෙන් එකල එහි පරිවේණාධිපතිව වැඩවිසූ කළුකොඳයාවේ පඤ්ඤාසේකර නාහිමියන්ගේ ඉල්ලීම පරිදි පිරිවෙන් පන්ති පැවැත්වීම සඳහා සවස් වරුවේ නාලන්දා විද්‍යාලය ලබා දීමට එකඟවීම කරුණානන්ද යුගයේදී බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් නාලන්දාව ඉටු කරනු ලැබූ මහඟු මෙහෙවරක් විය.

1964 දී නාලන්දාවේ අභිවෘද්ධිය සඳහා විදුහල්පති ලෙස පත්කර එවනු ලැබූයේ ගුණපාල වික්‍රමතුංග මැතිඳුනුයි. නැවතත් නාලන්දාව පුබුදු කළ මෙතුමා ඔහුගේ කාලයේදී තක්ෂිලා නම් කාර්මික විද්‍යාලය නාලන්දාවට පවරා ගැනීමට කටයුතු කරනු ලැබීය.

1969 දී නාලන්දාව ස්වර්ණමය යුගයකට කැඳවාගෙන යමින් විදුහල්පති ධූරයට පත්වූයේ සුගුණදාස අතුකෝරළ මහතායි. ආනන්දයේ සිට නාලන්දාව ආරම්භයේ දී නාලන්දාවට පැමිණි අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල මැතිතුමන් එවකට පැවති රජයේ අධ්‍යාපන ඇමති ලෙස නාලන්දාවේ අභිවෘද්ධිය සඳහා මෙතුමන් නාලන්දාවට පත්කර එවනු ලැබීය. වර්තමානයේ විද්‍යාලයේ දක්නට ලැබෙන ගොඩනැගිලි බහුතරයක් ඉදිවූයේ මෙතුමාගේ සමයේදී ය. භෞතික සම්පත් පමණක් නොව අධ්‍යාපනික කටයුතු වලින් ද ක්‍රීඩා අංශයෙන් ද විශිෂ්ඨ තත්ත්වයකට නාලන්දාව ඔසවා තැබීමට මෙතුමා සමත් විය.

දීර්ඝ කාලයක් නාලන්දාවේ සේවයේ යෙදී සිටි ධර්මා ගුණසිංහ මැතිතුමන් 1982 දී නාලන්දාවේ විදුහල්පති විය. මෙම වකවානුවේදී ලංකාවේ පාසලක ඉදි වූ ප්‍රථම භාෂා විද්‍යාගාරය නාලන්දාවේ ආරම්භ කරනු ලැබීය. 1990 දී විදුහල්පති වූ ඩී.පී. සුමනසේකර මහතාගේ පාලන කාලය කෙටි වුවත් සිදුවූ සේවාවන් විශිෂ්ඨ වේ. විශිෂ්ඨ ආදි නාලන්දියන් අභිනන්දනය කිරීම සඳහා නාලන්දා පුත්‍ර අභිනන්දන උළෙලත්, රණ විරුවන් සඳහා වීර පුත්‍ර සම්මාන උළෙලත්, සුමනසේකර යුගයේ ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘතීන් ය. තවද, මෙතෙක් සරසවියක හෝ විදුහලක ආරම්භ නොකළ අධිලේඛනාගාරයක් පිහිටුවීමට පුරෝගාමී වූයේ ද මෙතුමන්ය.

1999 දී විදුහල්පති ලෙස පත්වී ආ හේමන්ත ප්‍රේමතිලක මහතා වර්තමාන විදුහල්පති වෙයි. මෙතුමා නාලන්දාවට පත්ව ආ පසු සපුරන්නට වූ කාර්ය භාරය අධික විය. නැවතත් නාලන්දාව ස්වර්ණමය යුගයකට ගෙන යාම සඳහා මෙතුමන් කටයුතු කරනු ලබයි. අධ්‍යාපන හා භෞද්ධ ආගමික ක්‍රියාකාරකම් අතින් අද නාලන්දාව ඉදිරියෙන් සිටී.

මෙතුමාගේ මාර්ගෝපදේශය යටතේ නව ප්‍රේක්ෂකාගාරයක් සහ පිහිනුම් තටාකයක් ලැබී ඇත. නාලන්දාවේ අභිවෘද්ධියට අද ඇති ප්‍රධාන බාධකය වනුයේ ඉඩකඩ සීමිත වීමය. කෙසේ වෙතත් අසූහතර වෙනි සංවත්සරය සමරන මෙම වසරේ නාලන්දාව කීර්තිමත් විද්‍යාලයක් බවට පත්ව ඇත.

නාලන්දාවේ ආදි කර්තෘවරුන් සහ බෞද්ධ අධ්‍යාපනයේ නියමුවන් අපේක්ෂා කළ ප්‍රතිඵල අද රටට ලැබී ඇත. නාලන්දා සම්ප්‍රදාය ඇති කිරීමටත් පවත්වාගෙන යාමටත් හැකි වූයේ අති පූජනීය වූ ධර්මාචාර්ය හිමිවරුන් රැසකගේ අනුග්‍රහය නාලන්දාවට ලබා ගැනීමට හැකිවීමෙන්ය. නාලන්දාවේ කීර්තිමත් ධර්මාචාර්යවරුන් අතර අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහානාහිමි, පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි, පූජ්‍ය කිරුලපන විමල නාහිමි, පූජ්‍ය හීනටියන ධම්මාලෝක මහානාහිමි, පූජ්‍ය ගිංතොට භාරද්වාජ හිමි, පූජ්‍ය පරවාහැර වජිරඥාණ නාහිමි, ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි, පූජ්‍ය කලල්ලේ ආනන්ද සාගර නාහිමි, පූජ්‍ය දෙවුන්දර වාචිස්සර නාහිමි, වජිරාරාමාධිපති නාරද නාහිමි, පූජ්‍ය හෙට්ටිමුල්ලේ වජිරබුද්ධි ආදී නාහිමිවරු වෙති. විචිත්‍ර ධර්ම කථිකයෙකු ලෙස ජාත්‍යන්තරව ප්‍රසිද්ධියට පත් උඩවෙල්ලස්ස වජිරාරාමාධිකාරී පියදස්සී නාහිමි ද, විශ්ව විද්‍යාලයේ කුලපති ආචාර්ය පූජ්‍ය අලුත්වැව සෝරත නාහිමියන්ද, වර්තමානයේ ආදි නාලන්දීය බෞද්ධ සංගමයේ ප්‍රධාන අනුශාසක වන මතට ඇබ්බැහි වූ තරුණ පිරිස් සුමගට ගැනීමට ක්‍රියා කරන පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද නාහිමි ද, විචිත්‍ර ධර්ම කථික මීනුවන්ගොඩ දීපංකර හිමි, විරුප්පන සම්මානයෙන් පුද ලද, පූජ්‍ය කඩවත සමින්ද හිමි ආදී නාලන්දියන් වන මහා සංඝ රත්නයෙන් කිහිප දෙනෙකි.

නාලන්දාවෙන් බිහිවී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශ්ව කීර්තියට පත් විවිධ ක්ෂේත්‍ර වල නියුතු වූවන් බොහෝ වෙයි. රටට වැඩ ඇති දේශපාලනඥයින්, රණවිරුවන්, කලාකරුවන් ද රටට කීර්තියක් ගෙන දුන් ක්‍රීඩකයින්, විද්‍යාඥයින් සහ විවිධ වෘත්තිකයන් ද බොහෝ වේ. විශේෂයෙන් නාලන්දාවේ සිංහල බෞද්ධ සම්ප්‍රදාය අනුව යමින් කටයුතු කරන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ද, ගිහි බෞද්ධ ජනතාවගේ මූලිකයා වන දියවඩන නිලමේ තැන්පත් නිලංග දෑල මැතිතුමන්ද, බෞද්ධයන් අන්‍යාගමීකරණය පිළිබඳව කරුණු සෙවීම සඳහා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය මගින් පත් කරන ලද කොමිෂන් සභාවේ සභාපති සරත් ගුණතිලක මැතිතුමා ද ආදී නාලන්දියන් වන අපට අභිමානයකි.

නාලන්දාව ආරම්භයේදී අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහානාහිමියන් "නාලන්දා" යන නාමය ලබා දුන්නේ අතීතයේ භාරතයේ පැවති විශිෂ්ඨ බෞද්ධ විශ්ව විද්‍යාලයක් වූ "නාලන්දාව" සිහිපත් කරමිනුයි. මෝගල් අධිරාජ්‍යයේ කුරිරු ආක්‍රමණ හේතුවෙන් නාලන්දාව සම්පූර්ණයෙන් විනාශ විය. ගිහි පැවිදි ගුරු ශිෂ්‍ය පිරිස දොළොස් දහසකට වඩා ඝාතනයට ලක් විය. මිළ කළ නොහැකි අගනා පුස්තක සමග නාලන්දා මහා විහාරය ගිනිබත් විය. අද අප රට ද, සම්බුද්ධ ශාසනයද, මිෂනාරීන්ගේ සහ මූලධර්මවාදීන්ගේ කුමන්ත්‍රණ හමුවේ සසලව ඇත. එබැවින් අප අවදියෙන් සිට නාලන්දාව පමණක් නොව සියලු බොදු පාසල් රැකගනිමු. එයම අපේ රටේ අනාගතය තීරණය කිරීමට හේතුවෙයි.

සැකසුම : පානී වෑවල

IIE 2600

සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළ ගැසෙමු

සම්බුද්ධත්ව ජයන්තිය පිළිබඳ විශේෂ ලිපියක් ලබන කලාපයේ බලාපොරොත්තු වන්න ......

ධෛර්යයෙන් හා වීර්යයෙන්
පිරිපුන් තරුණ්‍යය
ඔබ විරුවෙකු කරයි.
එන්න අප හා එක්වන්න.
මහ සයුර දිනන්නට

නාලන්දා
ජීවිතාරක්ෂක සංගමය

(මේ දක්වා ජීවිත 605 ක්
මරණයෙන් මුදවාගෙන ඇත.

මුද්‍රණ අනුග්‍රහය

# බුදු සසුනට එක්ව නාලන්ද විදු පියස ඔපවත් කළ මහ නාහිමිවරු

## අතිපූජ්‍ය අලුත්වැව සෝරත නායක ස්වාමීන් වහන්සේ



Ven.Dr. Aluthwewe Soratha Nayala Thera (M.A. Ph.D) Chief Incumbent of the Kiri Wehera Raja Maha Viharaya, Kataragama (Chief Sangha Nayaka of the Ruhuna Magampattu) Chancellor of the Uva Wellassa University.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම අලුත්වැවදී 1943 අප්‍රේල් මස 05 දින දහනායක විදාන මහතා සහ කරුණාවතී දිසානායක මැණිකේ යුවළගේ සිව්වෙනි දරුවා ලෙස ඔහු මෙලොව එළිය දුටුවේය.

අලුත්වැව රජයේ මිශ්‍ර පාසලෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ ඔහු පසුව නාලන්දාවේ ද අධ්‍යාපනය ලබා ඇත.

වයස අවු. 14 දී 1957 නොවැම්බර් මස 08 දින අලුත්වැව ශ්‍රී මේධංකර පරත්තේ ශ්‍රී ආනන්ද හා පොළොන්නරුවේ ශ්‍රී රේවත යන නා හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් අලුත්වැව සෝරත නමින් පැවිදි විය. 1963 මැයි මස 31 දින උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලැබූහ.

පසුව ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රාචාර්ය - ශාස්ත්‍රපති ආචාර්ය උපාධි ලබා ගත්හ. ගුරුවරයෙකු වශයෙන් සේවය කරමින් 1987 දී කතරගම මහා විද්‍යාලයේ විදුහල්පති බවට පත් වූයේය.

කතරගම ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේ සභාපති ධුරය ද, මොණරාගල හම්බන්තොට දෙදිසාවේ විහාරාධිපති සංගමයේ සභාපති ධුරය ද කතරගම බෞද්ධ සංගමය නිලතල හොබවමින් තවත් බොහෝ සංගම් වල අනුශාසකවරයෙකු වශයෙන් රටටත් දහමටත් කෙරෙන සේවාව අතිවිශිෂ්ටය.

කුඩා ගල් අමුණ ව්‍යාපාරය මගින් මැණික් ගඟ හරස් කර කතරගම ප්‍රදේශයේ කුඩා වැව් වලට ජලය ලබා දී යල මහ දෙකටම වගාකිරීම වෙනුවෙන් නාහිමියන්ගේ උත්සාහය සාර්ථක විය.

ගම්මාන ඉදිකර නිවාස තනා දීම, තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීම සහ තවත් බොහෝ කටයුතු සඳහා නාහිමිපාණන් වහන්සේ පුරෝගාමී වූහ.

64 වන වියෙහි පසුවන නාහිමිපාණන් වහන්සේ දැනට කිරි වෙහෙර රජමහා විහාරාධිපතිව වැඩ වාසය කරයි.

ශාසනික සේවය හා සමාජ සේවය කරන ආචාර්ය අළුත්වැව සෝරත හිමියන්ට නිදුක් නිරෝගී සුවය පතමු.

## නුගේගොඩ රේවත හිමිපාණෝ

මොල්ලිගොඩ ලියනගේ ආතර් පෙරේරා බලයලත් මිනින්දෝරු තැනගේ සහ ලොකුකැටගොඩගේ ජොසපින් සොපායා පෙරේරා මහත්මියගේ වැඩිමල් පුත්‍රයා වූයේ මොල්ලිගොඩ ලියනගේ පියසිරි පෙරේරාය. පාසලේදී "එච්.එල්.පී." නම් විය. ඔහු උපන්නේ 1946 ජූලි මස 05 දිනදීය.

1951 දී නාලන්දාවට ඇතුලත් වූ ඔහු 1964 දී නාලන්දා මාතාවට ආයුබෝවන් කීවේය. 1963-1964 වසර වලදී ඔහු මා සමඟ එකම පන්තියක ඉගෙනුම ලැබූ කල්‍යාණ මිතුරෙකි. ඉගෙනීම් කටයුතු වල හොඳින් නියැලුන ඔහු නාලන්දාවේදී ද නිශ්ශබ්ද චරිතයක් විය.

ඔහු අති පූජ්‍ය නාරද හිමිපාණන්ගේ ධර්ම දේශනයක් අසා පැවිදිවීමට ඉටා ගත්තේය. ඔහු ඒ බව නාරද ස්වාමිපාදයාණන් හට සැල කර සිටියේය. උන්වහන්සේ දෙමාපිය කැමැත්ත නැතිව මහණ කරවීමට නොහැකි යැයි පැවසූහ. පවුලේ වැඩිමලා වූ පියසිරි ට බාල නැගණියක් හා සොහොයුරෙකු සිටි. පවුලේ වැඩිමලා නිසා දෙමාපිය කැමැත්ත ලබා ගත්තේ ඉතා අසීරුවෙනි.

1965 ඔක්තෝම්බර් මස 30 දා මිහින්තලේ කළුදිය පොකුණ සේනාසනයේදී අපේ එච්.එල්.පී. නුගේගොඩ රේවත නමින් පැවිදි විය. ඔහුගේ ආචාර්ය උපාධ්‍යයන් වූයේ කම්මට්ඨානාචාර්ය පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නාහිමිපාණන් වහන්සේ හා පූජ්‍ය කහටපිටියේ ශ්‍රී සුමතිපාල නායක ස්වාමීන් වහන්සේලාය.

පූජ්‍ය නුගේගොඩ රේවත ස්වාමීන්වහන්සේ විදර්ශනා භාවනාව පිළිබඳව සයමාසික පුහුණුවක් ලබාගත්තේය. උන්වහන්සේ කොළඹ ඇක්වයිනාස් ආයතනයේ වැඩිදුර අධ්‍යාපනය ලබා ගත්තේය. විවෘත විශ්ව විද්‍යාලයෙන් ඉංග්‍රීසි ඩිප්ලෝමා සහතිකය ද ලබා ගත්තේය.

විනය, සූත්‍ර, අභිධර්ම යන පිටකය ඉතා හොඳින් අධ්‍යයනය කළ උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙණ වෙතින් ගෞරව සාමාර්ථයක් සහිතව ත්‍රිපිටකාචාර්ය උපාධිය ලබා ගත්තේය. 1979 වසර දක්වා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල භාවනා මධ්‍යස්ථාන වලදී භාවනාව ප්‍රගුණ කළ උන්වහන්සේ දැන් බෙල්ලන්විල රාජමහා විහාරස්ථානයේ වැඩම කර සිටී.

ඉංග්‍රීසි භාෂාවෙන් බණ කීමට දැඩි උනන්දුවක් දැක්වූ රේවත ස්වාමීන් වහන්සේ නාලන්දාවේ ආචාර්යවරයෙකු වූ පී.ටී.ඩී. ජේම්ස් මහතාගෙන් වැඩිදුරටත් ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කළේය. උන්වහන්සේ බණ පටිගත කර ජේම්ස් මහතා වෙත ඉදිරිපත් කර වැරදි නිවැරදි කර ඉංග්‍රීසි භාෂාවෙන් බණ දෙසුවේය. ඓතිහාසික බෙල්ලන්විල රජමහා විහාරයට පැමිණ විදේශිකයින්ට සරලව ඉංග්‍රීසි බසින් විදර්ශනා භාවනාව පිළිබඳව කරුණු කාරණා තේරුම් කරදෙති. වරින්වර ඉන්දියාවටත් සිංගප්පූරුවටත් ගොස් ධර්ම ප්‍රචාර කටයුතු වල යෙදී ඇත.

1960 ගණන් වලදී නාලන්දාවේදී ඔහුගේ ගිහි කල ගුරු පියවරුන් වූයේ ආචාර්ය ඒ.ටී. ආරියරත්න, ධර්ම ගුණසිංහ, පී.වික්ටර් ද සිල්වා, ඩී.එස්. සේනානායක, කේ.බී.ඩී. රොමියෙල්, ටී. එස්. සිල්වා මහතා යන ශ්‍රේෂ්ඨ ගුරුතුමන් සහ පද්මිණී කැනතිගොඩ ආදී ගුරු මෑණිවරු පියවරු වූහ. පාසලේදී සම කාලීනයන් වූයේ චේතිය ශ්‍රී නම්මුණි, සුනිල් ද අල්විස්, ඕස්ට්‍රේලියාවේ වෙසෙන ආනන්ද මෙන්ඩිස් හා අනුරුද්ධ ලියනගේ, එංගලන්තයේ වෙසෙන ශර්මන් ජයතිලක හා අනුර ජයසිංහ, සාලින්ද රොද්‍රිගෝ, ආචාර්ය පැරකුම් ඕවිටිලග, ඒ.එල්. දයානන්ද පෙරේරා යන මිතුරන්ය.

බෙල්ලන්විල රජමහා විහාරයේ දහම් පාසලේ ආචාර්යවරයෙකුව සේවය කරමින් සිදුකෙරෙන ශාසනික මෙහෙවර ඉතා ප්‍රශංසනීයයි. ශාසනික සේවයෙහි නිරත වීම සඳහා අපි උන්වහන්සේට නිදුක් නිරෝගී සුවය හා චිර ජීවනය පතමු.

**ඩෝල්ටන් වක්වැල්ල**

# ස්වාමීන් වහන්සේලා විසින් ගිහි ජනතාවට සෙත් පතන ගාථාව

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණෝ සුඛං බලං
ආයුරාරෝග්‍ය සම්පත්ති - සග්ග සම්පත්ති මේවච
අථෝ නිබ්බාන සම්පත්ති - ඉමිනා තෙ සමිජ්ජතු

**තේරුම : (වචන වල)**

| | |
|---|---|
| අභිවාදන - | ගෞරවයෙන් වදින |
| නිච්චං වද්ධාපචායිනෝ - | නිතර සීලයෙන් හා නුවණින් වැඩිහිටියන් පිදීම |
| ආයු - | ආයුෂය නොහොත් ජීවිතයේ පැවැත්ම |
| වණ්ණෝ - | ජවි වර්ණය හෙවත් සමේ පැහැය |
| සුඛං - | සිතේ සහ කයේ සුවපත් භාවය හෙවත් සැනසිල්ල |
| බලං - | කාය ශක්තිය හා ඥාණ ශක්තිය |
| චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - | මේ ගුණ හතර වර්ධනය වේ |
| ආයුරාරෝග්‍ය සම්පත්ති - | නිදුක් නිරෝගී සැප |
| සග්ග සම්පත්ති - | දිව්‍ය සම්පත් |
| අථෝ නිබ්බාන - | මේ පිනෙන් |
| ඉමිනා තේ සමිජ්ජතු - | නිවන් සම්පත් |

**ඉහත ගාථාවේ තේරුම කෙටියෙන් :**

නිතර සීලයෙන් හා ගුණයෙන් තමාට වඩා වැඩිහිටියන් වැඳුම් පිදුම් කරන්නාගේ ආයුෂ, වර්ණය, සැපය, බලය යන කරුණු හතර වැඩි දියුණු වේ. තවද නිදුක් නිරෝගී සැප හා දිව්‍ය සම්පත් ද මේ පිනෙන් ඔබට නිවන් සම්පත් ද ලැබේවා

# නාලන්දා සිසුනට ශිෂ්‍යාධාර .....

නාලන්දා සෙවණේ හැදී වැඩී ජාතියට නායකත්වය දුන් ජාතිය පෝෂණය කළ විශ්ව කීර්තියට පත් ගිහි පැවිදි දෙපක්ෂයම එමටය. දැනුම සංවර්ධනය කර ගැනීමට සමගාමීව පරාර්ථ සේවය, පරිසරයට සංවේදී වීම, වැඩිහිටියනට ගරුක වීම ආදී ගති පැවතුම් වලින් පෝෂණය වීම නාලන්දීයයන්ගේ අනන්‍යතාවයි.

ශ්‍රී ලංකාව බහු ජාතික, බහු ආගම් වලින් සමන්විත දේශයකි. අප රටේ මුස්ලිම් ජාතිකයින් ද්‍රවිඩ ජාතිකයින් මෙන්ම සිංහල කතෝලිකයන් ද ඉතාමත්ම සංවිධානාත්මකව තම වර්ගයා ගොඩ නැගීමේ උත්කෘෂ්ඨ උත්සාහයක යෙදී සිටී. ඔවුනගේ මෙකී උත්සාහයනට ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබෙන පිටිවහල අති මහත්ය.

එහෙත් ශ්‍රී ලංකාවේ වෙසෙන බහුතරය වන සිංහල බෞද්ධයින්ට මෙම අවස්ථාව උදාවී නොමැත. බොහෝ දෙනා උප්පත්තියත් සමග යම් යම් ඌණතා රැගෙන මෙලොවට බිහිවෙති. සිංහල බෞද්ධයින් මුහුණ පා ඇති ප්‍රධානතම ඌණතාව ආර්ථික ප්‍රශ්නයි. විශේෂ කුසලතා ඇතිව මෙලොව උරුම කරගත් බොහෝ සිංහල බෞද්ධයින් ආර්ථික අපහසුකම් වලට ගොදුරු වී ඇත. ඔවුන්ගේ විශේෂ කුසලතා ඔප් නංවා ගැනීමට සංවර්ධනය කර ගැනීමට ආර්ථික අපහසුකම් හරස් වී ඇත. විශේෂ දක්ෂතා නිපුණතා කුසලතා වලින් පරිපූර්ණ ශිෂ්‍යයන්ට අත හිත දීමේ සංවිධානාත්මක ක්‍රම සහ විධි කතෝලික පල්ලිය, මුස්ලිම් සංවිධාන සහ හින්දු සංවිධාන මගින් ක්‍රියාත්මක කරති. නමුත් ජාතියක් වශයෙන් හිස එසවීමට සිංහල බෞද්ධයිනට ලැබෙන ආධාර ඉතාමත්ම විරලය.

එසේ හෙයින් දැනුම, විශේෂ නිපුණතා, කුසලතා ඇති ආර්ථික අගහිගකම් වලින් පෙලෙන නාලන්දා ශිෂ්‍යයිනට අත හිත දීම සඳහා ශිෂ්‍යාධාර සැපයීමට ආදී නාලන්දීය බෞද්ධ සංගමය කටයුතු ආරම්භ කර ඇත. මෙහි ප්‍රථම අදියර වශයෙන් (2008 ජූලි) ශිෂ්‍යාධාර පහකින් අපි ආරම්භ කළෙමු. ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය පුළුල් කිරීම අපගේ අභිලාෂයයි.

පොහොසත් නිවෙස් වල මුළුතැන්ගෙයි සේවය කරමින් නාලන්දා සෙවණේ හැදෙන වැඩෙන, කුසලතා පූර්ණ, තම දරුවා ගොඩ ගැනීමේ උත්සාහයක යෙදෙන අම්මලා ඇති බැව් දැනගත හොත් ඔබ මවිත වනු ඇත. මෙයට වඩා ඉතාමත් ආර්ථික අපහසුතා ඇති. එහෙත් දක්ෂතා ඇති සංවර්ධනය කළ හැකි කුසලතා ඇති, ජාතියට නායකත්වය දිය හැකි, විශ්ව කීර්තියට පත් විය හැකි දරුවන් නාලන්දා මව් සෙවණේ ඇති දැඩි වෙති. ඔවුනට අවශ්‍ය වනුයේ පිං කැමති ඔබ සැමගේ සහයෝගය සහ ආධාරයයි.

එබැවින් නාලන්දාවට සම්බන්ධ උදව් කළ හැකි උදව් දිය හැකි මව්වරුනි, පියවරුනි, ආදී ශිෂ්‍යයිනි, මෙවන් මහගු පිංකමකට සහභාගි වීමේ අවස්ථාව ඔබට විවෘතව ඇත. මෙම විවෘත ආරාධනය ඔබ සැමටයි. අගහිඟකම් ඇති ශිෂ්‍යයෙකුට ආධාර වී සුගතියේ දොර විවෘත කර ගන්න. ඒ හරහා නිවන් දොර විවෘත වීමේ පාරමිතාවක් වනවා නිසැකය. දන් දී පිං කර සුගතියට මග පාදා ගන්නා වාගේම සසර වසනතුරු විපාක ලැබෙන විශාල කුසලයක් බවට පරිවර්තනය කර ගනිමු.

**විධායක සාමාජිකයින්ගෙන් ලැබුණු මුදල් 65,500/-**

# ආදී නාලන්දීය බෞද්ධ සංගමයේ සාමාජිකත්වය සඳහා අයැදුම් කිරීම

අප සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අදාල සාමාජික අයදුම්පත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

අවම වශයෙන් එක් වරක් වත් අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා විද්‍යාලයෙන් පෙනී සිටි සිසුනට මේ සඳහා අයැදුම් කළ හැකි අතර ඔවුන් සඳහා පහත සඳහන් පරිදි යාවජීව සාමාජිකත්වය පිරිනමනු ඇත.

අ) විද්‍යාලයේ අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසුව වසරක් ඇතුළත සාමාජිකත්වය සඳහා අයදුම් කරන්නෙකුට රු. සියයක (රු. 100/-) පමණ සාමාජික මුදලක් ගෙවීමෙන්.

ආ) අනෙකුත් සියළුම ආදී සිසුනට රු. පන්සියයක (රු. 500/-) පමණ සාමාජික මුදලක් ගෙවීමෙන්

සාමාජික අයදුම්පත් කොළඹ 10 සිරි ධම්ම මාවතේ අංක 90 දරණ ස්ථානයේ පිහිටි "වොයිස් ඔෆ් මිතුරු මිතුරෝ" කාර්යාලයෙන් ලබාගත හැකි අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සාමාජික මුදල සමගින් (චෙක්පතකින් හෝ තැපැල් ඇණවුමකින්)

**ප්‍රධාන ලේකම්,**
**ආදී නාලන්දීය බෞද්ධ සංගමය,**
**නාලන්ද විද්‍යාලය, කොළඹ 10.**

යන ලිපිනයට තැපැල් මගින් යොමු කළ හැක. එසේ නොමැති නම් සෑම මසකම පෙවෙනි බ්‍රහස්පතින්දා දින සවස 6.00 සිට සවස 8.00 දක්වා සංගමයේ මාසික විධායක කමිටු රැස්වීම විද්‍යාලයේදී පැවැත්වෙන බැවින් එදිනට ඔබගේ අයදුම්පත සහ සාමාජික මුදල ගෙනැවිත් බාරදීමට ද පුළුවන.

# නාලන්ද බොදු හඬට අනුග්‍රහය

අප සංගමය විසින් නොමිලයේ නිකුත් කරනු ලබන "නාලන්ද බොදු හඬ" ඔබ අතට පත්කිරීම සඳහා මුද්‍රණ වියදම් මෙන්ම තැපැල් ගාස්තු වශයෙන් ද සැලකිය යුතු මුදලක් දැරීමට සිදුව ඇති නිසාත් පුවත් ලිපිය නොකඩවා පළකිරීම සඳහාත් යම් අනුග්‍රහයක් දැක්වීමට ඔබ කැමැත්තේ නම්,

**"ආදී නාලන්දීය බෞද්ධ සංගමය"** නමට ලියන ලද චෙක් පතක් අප වෙත යොමු කිරීමෙන් හෝ **සම්පත් බැංකුවේ අංක 0004-6000-1404** දරණ ගිණුමට ඔබගේ නොමසුරු ආධාරය බැරකිරීමෙන් හෝ දායක විය හැකි බව දන්වනු කැමැත්තෙමු.